# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2153/14 - 2019 දෙසැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කරච්චි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කරච්චි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කරච්චි ප්‍රාදේශීය සභාවේ අංක 8 වට්ටකච්චි කොට්ඨාසයට තේරී පත් වූ සදාසිවම් පොන්නුත්තුරෙ අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කරච්චි ප්‍රාදේශීය සභාවේ අංක 8 වට්ටකච්චි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අන්තෝනිප්පිල්ලෙ සිවකුමාරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

කරච්චි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී ඩෙනිසියස් කැනියුඩ් අරවින්දරාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අන්තෝනිප්පිල්ලෙ සිවකුමාරන් කරච්චි ප්‍රාදේශීය සභාවේ වට්ටකච්චි අංක 8 කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩී. සී. අරවින්දරාජ්,
තේරීම්භාර නිලධාරී,
කරච්චි ප්‍රාදේශීය සභාව.

2019 දෙසැම්බර් මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කිලිනොච්චිය.

12 - 890/1

**(262 අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කරච්චි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කරච්චි ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කරච්චි ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ ප්‍රබාමණී ගනේසමූර්ති අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කරච්චි ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ලලිතකුමාරි සත්තියමූර්ති නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

කරච්චි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී ඩෙනිසියස් කැනියුඩ් අරවින්දරාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ලලිතකුමාරි සත්තියමූර්ති කරච්චි ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩී. සී. අරවින්දරාජ්,
තේරීම්භාර නිලධාරී,
කරච්චි ප්‍රාදේශීය සභාව.

2019 දෙසැම්බර් මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කිලිනොච්චිය.

12 - 890/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.